museum of modern
and contemporary art
sri lanka

Quarterly Newsletter #5 – November 2023

## ‘ආගන්තුකයෝ’ ලන්ඩනයේ Frieze සතියේදී

අපගේ පසුගිය ප්‍රදර්ශනයවන ‘ආගන්තුකයෝහි’ සංදර්ශිත කලාකරුවන්ගේ චිත්‍රපට ඇතුළත්, මුළුමනින් ම අලෙවිවූ සන්ධ්‍යාවක් ඔක්තෝම්බර් 12 දින ලන්ඩනයේදී අපි පැවැත්වූ බව MMCA ශ්‍රී ලංකා නිවේදනය කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි. The Photographers’ Gallery හිදී ඔවුන් සමග හවුලේ පැවැත්වූ මෙම වැඩසටහනේදී දිනෙල්ක ලියනගේ, හානියා ලුතුෆි, ඉමාද් මජීද්, නීනා මංගලනායගම්, සහ සුමුදි සුරවීරගේ කලාකෘති ප්‍රදර්ශනය විය. මෙම දර්ශනයෙන් අනතුරුව, MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා හා අභිරක්ෂක සන්දේව් හැන්ඩි, සහ කලාකරුවන්වන මංගලනායගම් හා රෙජිනෝල්ඩ් එස්. ඇලෝසියස් අතර සංවාදයක් පැවැත්වුණු අතර, එක්සත් රාජධානියේ වෙසෙන අභිරක්ෂක, ලේඛක, සහ පර්යේෂක හමාද් නසර් විසින් එය මෙහෙයවන ලදී. මෙම තිරගතකිරීම් සහ සංවාද සන්ධ්‍යාව මේ වසරේ Frieze Week (ඔක්තෝබර් 11–15) අතරතුර පැවැත්විණි.

## ‘ආගන්තුකයෝ’ සාර්ථකව අවසන් වෙයි

මේ අතර, නරඹන්නන් 10,377ක් ආකර්ෂණයකරගත් මාස හයක දර්ශනයකින් පසුව ‘ආගන්තුකයෝ’ ප්‍රදර්ශනය ඔක්තෝම්බර් 22 වන දා අවසන් විය. අප පැවැත්වූ මහජන වැඩසටහන් 64ට, ගැලරි කතා නවයක්, වැඩමුළු 8ක්, කියවීම් කණ්ඩායම් පහක්, අභිරක්ෂක සංචාර 11ක්, අභිවහන තුනක්, ළමුන් සඳහා කියැවීම් සැසියක් සහ, ‘ආගන්තුකයෝහි’ සංදර්ශිත දනුෂ්ක මාරසිංහ සහ කේ. කේ. ශ්‍රීනාත් චතුරංගගේ ‘Text-ing-Be-ing’ (2019) අභිවහනයේ සජීවීකරණයක් ඇතුළත් විය. කෙසේ වෙතත්, අප වඩාත් සතුටට පත්වන්නේ ජාතික තරුණ සේවා සභාව ඇතුළු දිවයින පුරා පාසල් සහ උසස් අධ්‍යාපන ආයනවල සිසුන් 518 දෙනෙකුගේ පැමිණීම් පිළිබඳවයි.

සෑම විටෙක ම මෙන්, MMCA ශ්‍රී ලංකාහි බාහිර අධ්‍යාපනඥයින් අපගේ නරඹන්නන් ප්‍රදර්ශනය හා සම්බන්ධ කිරීමට අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටුකළ අතර, ‘ආගන්තුකයෝ’ සඳහා ස්ථානාලෝක 805ක්, සංදර්ශක සංචාර 63ක්, සහ ප්‍රදර්ශන සංචාර 95ක් ද ඔවුන් පැවැත්වීය.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

එපමණක් නොව, 'ආගන්තුකයෝ' පිළිබඳව පසුගිය මාසයේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 'The National' හි 'කලාව සහ සංස්කෘතිය' කොටසේ විශේෂාංගයක් පළවිය. මෙම අපූරු සමාලෝචනය වෙනුවෙන් ශාහිමා ෆාහිම්ට ස්තුතිය පළකරන්නෙමු.

ළමා දිනය සැමරීම සඳහා අපි සැප්තැම්බර් 30 සහ ඔක්තෝම්බර් 1 දිනවල විශේෂ මහජන වැඩසටහන් කිහිපයක් පැවැත්වූ අතර, ඊට ළමා ක්‍රියාකාරකම් සැසි හතරක්, වැඩමුළුවක්, සහ අපගේ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා විසින් මෙහෙයවූ විශේෂ ළමා දින අභිරක්ෂක චාරිකාවක් ද ඇතුළත් විය. සහභාගීවූ සැමට ස්තුතියි!

## එකතුකරන්නෙකු වන අනෝජි අමරසිංහගේ ආරාධිත පැමිණීම

'ආගන්තුකයෝ' ප්‍රදර්ශනයට නොමසුරුව සහය දුන් ලන්ඩනයේ එකතුකරන්නෙකු වන අනෝජි අමරසිංහ, අගෝස්තු 24 දින කෞතුකාගාරයේදී අපගේ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සමග ''Who's Afraid of Contemporary Art' යන්න මාතෘකාව කරගත් සංවාදයක් සඳහා පැමිණීම පිළිබඳව අපි සතුටු වෙමු. අනෝජි සහ ශාර්මිණී නව ආකාරයේ කලා අනුග්‍රාහකත්ව, පරමාදර්ශී අනුග්‍රාහකයෙකු වන්නේ කෙසේ ද, සහ සමකාලීන කලාවට අනුබලදීමට සම්බන්ධවන්නේ කෙසේ ද යන්න පිළිබඳව කතා කළහ.

## වේලාසනින් ආ නත්තල් තෑගි

මේ නත්තලේ ඔබේ ආදරණීයයන්ට සීමිත සංස්කරණ සරම් සහ සළු තිළිණකරන්න! Selyn සහ MMCA ශ්‍රී ලංකා විසින් නිර්මාණයකළ මෙම සුවිශේෂ අත්කම් රෙදිපිළි ජෝර්ජ් කීට්ගේ (1901–1993) සිතුවම් දෙකකින් ආභාෂය ලබා ඇත. ඔබට සහ ඔබේ ආදරණීයයන්ට, කලා ලෝලීන් ළඟ අනිවාර්යයෙන් ම තිබිය යුතු මෙම භාණ්ඩවලට වඩා හොඳ නත්තල් තෑගි තිබේ ද? මෙම සීමිත සංස්කරණ සළුව හෝ සරම ඇනවුම් කිරීමට https://www.instagram.com/mmcasrilanka/ MMCA ශ්‍රී ලංකා ඉන්ස්ටග්‍රෑම් පිටුව හෝ facebook.com/mmcasrilanka/ ෆේස්බුක් පිටුව හරහා අපට සෘජු පණිවිඩයක් එවන්න.

## අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය

ඉදිරිය බැලීමේදී, 'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' නම් වූ අපගේ මීළඟ ප්‍රදර්ශනය නොවැම්බර් 30 දින විවෘතවන බව අප නිවේදනය කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි. තිනාල් සජීව සහ නිමායා හැරිස්ගේ සහාය ඇතිව ශාර්මිණී පෙරේයිරා සහ රිවෙල් මාසලින් විසින් අභිරක්ෂණයකළ 'අක්කර 88', MMCA ශ්‍රී ලංකාහි පළමු ඒකල ප්‍රදර්ශනයවන අතර, පුරෝගාමී ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පියෙකුවූ මිනෙට් ද සිල්වා විසින් කළ (1918–1998) වටපුළුව නිවාස යෝජනා ක්‍රමය දෙස බලනු ඇත. මෙය

ලෝක ස්මාරක අරමුදලේ (World Monuments Fund) අනුමතිය ලත්, ශ්‍රී ලාංකීය නූතන ගෘහ නිර්මාණ ශිල්පියෙකු පිළිබඳව කෙරෙන ප්‍රථම ප්‍රදර්ශනය ද වේ.

ඉරුෂි තෙන්නකෝන් (උ.1989), සුමේධ කැලේගම (උ. 1988) සහ සුමුදු අතුකෝරල (උ. 1980) නිර්මාණයකළ, වටපුළුව නිවාස යෝජනා ක්‍රමය කෙරෙහි අවධානය යොමුකරන ‘is this an architectural documentary?’ (2023) නම් වූ කලාකරුවන්ගේ චිත්‍රපටයද ‘අක්කර 88’ දී මුල්වරට ප්‍රදර්ශනයවනු ඇත. මෙම චිත්‍රපටය බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඩිජිටල් සහයෝගීතා අරමුදලෙන් සහය ලබන අතර එය ඩිජිටල්මය නව සහයෝගීතා ක්‍රම දියුණුකිරීම උදෙසා එක්සත් රාජධානියේ සහ විදේශීය සංස්කෘතික සහයෝගීතාවයන්ට සහය දක්වයි. MMCA ශ්‍රී ලංකා විසින් පවරන ලද මෙම චිත්‍රපටයට පර්යේෂණ සහ සංවර්ධන සහය එක්සත් රාජධානියේ Forensic Architecture ආයතනය විසින් සපයන ලදී.